# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No: 10120

ෆැක්ස් / தொலைநகல / Fax: 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone: 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site: www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail: dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO: 227 /2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No: / 2024

දිනය / திகதி / Date: 08/02/2024 පැය 1735

**මාධ්‍ය නිවේදනය**

**කුඩා දරුවන් දෙදෙනෙකු කෲරත්වයට පත්කළ සැකකරුවෙකු අත්අඩංගුවට - දිඹුලපතන පොලිස් වසම.**

2024.02.05 වන දින රාත්‍රී කාලයේ දිඹුලපතන පොලිස් වසමේ පතන ප්‍රදේශයේ දී පියා විසින් තම කුඩා දරුවන් දෙදෙනා කෲරත්වයට පත්කිරීමක් සම්බන්ධයෙන් 2024.02.06 වන දින දිඹුලපතන පොලිස් ස්ථානයට ලද පැමිණිල්ලක් මත විමර්ශනයක් ආරම්භ කර ඇත.

සැකකාර පියා විසින් අවුරුදු 05 හා 10 වයස්වල පසු වන ඔහුගේ පිරිමි දරුවන් දෙදෙනාට බැන වදිමින් පහර දීමක් සිදු කරමින් එය වීඩියෝ ගත කර එම දර්ශන වට්ස් ඇප් මඟින් විදේශ ගතව සිටින දරුවන්ගේ මව වෙත යවා ඇත. අනතුරුව මව විසින් මේ සම්බන්ධව දිඹුලපතන පොලිස් ස්ථානයට වාර්තා කර ඇත.

පොලිසිය සිදු කල විමර්ශනයේදී සැකකරු ළමුන් දෙදෙනා සමඟ ලිදුල පොලිස් වසමේ පිහිටි සැකකරුගේ නිවස වෙත ගොස් ඇති බවට අනාවරණය වීමෙන් පසු සැකකරු අත්අඩංගුවට ගැනීම සඳහා ලිදුල පොලිස් ස්ථානය දැනුවත් කර ඇත. ඒ අනුව 2024.02.07 වන දින ලිදුල පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් සැකකරු අත්අඩංගුවට ගෙන ඇති අතර, දරුවන් දෙදෙනාද පොලිස් භාරයට ගෙන සැකකරුද සමඟ දිඹුලපතන පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 45 ක් වූ නාගසේන ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

කෲරත්වයට පත් දරුවන් දෙදෙනා දික්ඔය රෝහලට ඇතුලත් කර නේවාසිකව ප්‍රතිකාර ලබමින් සිටී. සැකකරු 2024.02.07 වන දින හැටන් ගරු මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කිරීමෙන් අනතුරුව 2024.02.19 වන දින දක්වා රක්ෂිත බන්ධනාගාර ගත කර ඇත. දිඹුලපතන පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**